# An Evaluation of the Centrally Important Ways in which Jean Rhys Unearths and Alters the Meaning of Antoinette's Story in *Wide Sargasso Sea* in the Context of Charlotte Brontë's Closed Interpretation of Bertha in *Jane Eyre*.

**Eisha Hewabowela**

මෙම ලිපියෙහි අරමුණ වනුයේ 20 වන සියවසේ ඉංග්‍රීසි නවකතාකාරියක වන ජෙන් රීස් (1894-1979) විසින් 1966 දී රචිත "වයිඩ් සාගසෝ සී" නම් වූ කලා නිර්මාණය තුළින්, 19 වන සියවසේ ලෝ ප්‍රකට වික්ටෝරියානු නවකතාකාරියක වන චාලට් බ්‍රොන්ටේගේ "ජේන් අයර්" කෘතියේ වන බර්තා කොරදව් කථානායිකාවට ඇයගේ ඉංග්‍රීසි සැමියාගෙන් හමු මනාරම් නිවසක තුළ දී මුහුණ පෑමට සිදුවන, දිගුකාලීන, සූක්ෂම ලෙස සැලසුම් කර ගන්නා වූ, ශාගත්ත අසාධාරණකම හමුවේ, ඇය විකෘති මනසක් කරා ඇද වැටී යන ආකාරය, අතිශය සංවේදී වූත්, පිළිගත හැකි වූත්, සියුම්, නව අර්ථකථනයක් තුළින් ඉදිරිපත් කිරීමට රීස් දරන ප්‍රයත්නය, විග්‍රහ කොට ඇගයීමකට ලක් කිරීමයි. මේ ඉලක්කය කරා යැමට ඇය අලුත් කලාත්මක සම්ප්‍රදායයන් කිහිපයක් ම ඉතා ම ආකර්ෂණීය අන්දමින් උපයෝගී කොට ඇත.